IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

## මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක 09

## ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ 2019 නොවැම්බර්)

## DDAMS 1004 – මත්ද්‍රව්‍ය උපදේශන ක්‍රමවේදය

**උපදෙස්**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි (03).

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

01. i. උපදේශනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 10)

ii. උපදේශන ක්‍රියාවලියේ පියවරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. මනෝවිද්‍යා උපදේශන න්‍යායන් මත්ද්‍රව්‍ය උපදේශනය සඳහා භාවිතා කරන්නේ කෙසේදැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. උපදේශකයකු සතුවිය යුතු කුසලතා මොනවාදැයි සාකච්ඡා කොට උපදේශකයකු විසින් නොකළ යුතු දෑ මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04.

i. මනෝ විශ්ලේෂණවාදී න්‍යායෙහි මූලික හරය පැහැදිලි කර එම ප්‍රවේශයට අනුව මානසික-ගැටළුවලට හේතු කවරේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. ෆ්‍රොයිඩ් (Freud) විසින් ඉදිරිපත් කරන ලද පෞරුෂ ව්‍යුහය ආශ්‍රිත අයිස්බර්ග් (Iceberg) සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. මත්ද්‍රව්‍ය උපදේශනය සහ සාමාන්‍ය උපදේශනය අතර වෙනස පැහැදිලි කර මත්ද්‍රව්‍ය උපදේශනයේදී සැලකිලිමත් වියයුතු කරුණු සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. හේතුවාදී ප්‍රවේශ **කෙටියෙන් පැහැදිලි කර** හේතුවාදී ප්‍රවේශයට අනුව පුද්ගලයාට මානසික ප්‍රශ්න ඇතිවන **ආකාරය උදාහරණ** සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. පුද්ගල කේන්ද්‍රීය ප්‍රවේශය කෙටියෙන් පැහැදිලි කර එම ප්‍රවේශයට අනුව සේවා ලාභියාගේ ධනාත්මක වෙනසක් ඇතිකිරීම සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් සියල්ල පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. චර්යාවාදී ප්‍රවේශය (Behavioral Approach)

ii. සහකම්පනය (Empathy)

iii. ආත්ම නිරාවරණය (Self-disclosure)

iv. ඇස් යොමුව (Eye Contact)

(ලකුණු 05 x 04 = 20)

********